# ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය

## අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2019 අගෝස්තු

## දෙවන වාර පරීක්ෂණය - 2019

## සාමාන්‍ය පොදු පරීක්ෂණය

**13 ශ්‍රේණිය** **කාලය පැය : 02 1/2**

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- 1 සිට 60 තෙක් වූ එක් එක් ප්‍රශ්නයට 1, 2, 3, 4, 5 යන පිළිතුරු වලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ලකුණු කරන්න

01. ඉන්දියානු සම්භවයක් ඇති ආහාරයක් නොවන්නේ මින් කුමක්ද?
(1) වඩේ (2) තොසේ (3) ඉට්ලි (4) චපාති (5) සුෂි

02. රටා යොදා වියන ලද ඊට්ට ආවේණික ඇසුරුමක් ඇත්තේ මින් කුමන ආහාරයේද?
(1) බූන්දි (2) කිරි ටොෆි (3) පුහුල් දෝසි (4) තල් හකුරු (5) තල කැරලි

03. ඉදුණු විට සම්පූර්ණයෙන්ම කහ පැහැ වන්නේ මේ අතරින් කුමන පලතුරද?
(1) මැංගුස් (2) ජම්බු (3) අනෝදා (4) ලාවලු (5) පේර

04. පපුවේ එක් අකුරක් සහිත ඇඳුමක් ඇඳ සිටින්නේ මින් කවුද?
(1) ස්පයිඩර් මෑන් (2) සුපර් මෑන් (3) සොනික්
(4) ස්කුබිඩු (5) ටිංටිං

05. මේ අතරින් ඩබ්.ඒ.සිල්වා මහතාගේ නවකතාවක් වන්නේ කුමක්ද?
(1) ලීලා (2) සෝමා (3) අයිරාංගනී (4) සුනේත්‍රා (5) නිලමණි

06. හේවිසි වාදනය සඳහා උපයෝගී කරගන්නේ මින් කුමන වාද්‍ය භාණ්ඩයන්ද?
(1) ගැටබෙරය, බුම්මැඩිය, තම්මැට්ටම (2) දවුල, හොරණෑව, බුම්මැඩිය
(3) දවුල, තම්මැට්ටම, හොරණෑව (4) තම්මැට්ම, කොම්බුව, හොරණෑව
(5) උඩැක්කිය, බටනලාව, ගැටබෙරය

07. ඉංග්‍රීසි භාෂාවෙන් සිංහලයට එකතු වූ වචනයක් නොවන්නේ මින් කුමක්ද?
(1) ටැංකිය (2) පැන්සල (3) ගැරුප්පුව (4) නෝට්ටුව (5) පෑන

08. සුප්‍රකට නළු ජෝ අබේවික්‍රම මහතා රඟපෑ චරිතයක් නොවන්නේ මින් කුමක්ද?
(1) සිරිබෝ අයියා හි සිරිබෝ අයියා (4) පරසතුමල් හි බොනී මහත්තයා
(2) බඹරු ඇවිත් හි ඇන්ටන් (5) තුං මං හන්දිය හි අබිලිං සිඤ්ඤෝ
(3) බැද්දේගම හි සිළිඳු

09. මුහුදු කැස්බෑවන් සංරක්ෂණය මූලික කර ගනිමින් ඒ සඳහා ඉදිවී ඇති සමුද්‍රීය රක්ෂිතය මින් කුමක්ද?
(1) හික්කඩුව ජාතික උද්‍යානය (4) උස්සන්ගොඩ ජාතික උද්‍යානය
(2) රූමස්සල අභය භූමිය (5) හම්බන්තොට උද්භිද උද්‍යානය
(3) රැකව අභය භූමිය

10. සුප්‍රකට කිවිඳියක වන ගජමන් නෝනාට නින්දගමක් ප්‍රදානය කළ ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා මින් කවරකද?

(1) ජෝන් ඩොයිලි (2) තෝමස් මෙට්ලන්ඩ් (3) රොබට් බ්‍රවුන්රිග්

(4) ෆෙඩ්රික් නෝර්ත් (5) තෝමස් මෝර්

11. ජර්මනියට අයත් ජාත්‍යන්තර ගුවන් තොටුපළක් නොවන්නේ මින් කුමක්ද?

(1) ෆ්රෑන්ක් ෆර්ට් (2) මියුනිච් (3) හීත්‍රෝ (4) එතිහාඩ් (5) හැම්බර්ග්

12. සුප්‍රසිද්ධ පිනෝකියෝ කතාමාලාවේ එන 'ජිප්පෙටෝ'' ගේ වෘත්තිය මින් කුමක් ද?

(1) වඩු කර්මිකයෙක් (2) පෙදරේරුවෙක් (3) කරණවෑමියෙක්

(4) සිත්තරෙක් (5) සපත්තේරුවෙක්

13. සුදු පැහැ ස්පටිකයක් නොවන්නේ මින් කුමක්ද?

(1) සෝඩියම් හයිඩ්‍රොක්සයිට් (2) මැග්නීසියම් කාබනේට් (3) කොපර් සල්ෆේට්

(4) කැල්සියම් කාබනේට් (5) අයන් සල්ෆයිඩ්

14. කැලණි ගඟ පදනම් කරගෙන නිර්මාණය වූ ජල විදුලි බලාගාරය මින් කුමක්ද?

(1) රන්ටැඹේ (2) ලක්ෂපාන (3) කොත්මලේ (4) වික්ටෝරියා (5) රන්දෙනිගල

15. 2019 ඔස්කා සම්මාන උළෙලේ හොඳම චිත්‍රපයට හිමි සම්මානය දිනා ගත්තේ මින් කුමන චිත්‍රපටියද?

(1) ග්‍රීන් බුක් (2) බොහේමියන් රැප්සොඩි (3) ද ෆේවරිට්

(4) රෝමා (5) ද රීඩර්

16. වැඩුණු මිනිසකු හා සමාන දත් සංඛ්‍යාවක් ඇති සත්වයා මින් කවරෙක්ද ?

(1) ඩොල්ෆින් (2) හාවා (3) ජිරාෆ් (4) අලියා (5) අශ්වයා

17. ටී ටුවෙන්ටි ක්‍රිකට් තරගයක තනි ඉනිමක මෙතෙක් වැඩිම ලකුණු ලබාගත් රට කුමක්ද?

(1) ඕස්ට්‍රේලියාව (2) ඇෆ්ගනිස්ථානය (3) ශ්‍රී ලංකාව

(4) ඉන්දියාව (5) පකිස්ථානය

18. දකුණු අප්‍රිකානු ක්‍රිකට් කණ්ඩායම තම රටේදී ටෙස්ට් තරගාවලියක් පරාජයට පත් කළ ප්‍රථම හා එකම ආසියානු ක්‍රිකට් කන්ඩායම කුමන රටකද ?

(1) ඉන්දියාව (2) බංගලාදේශය (3) ශ්‍රී ලංකාව

(4) ඉන්දියාව (5) ඉන්දුනීසියාව

19. සමපාද ත්‍රිකෝණයක එක් අභ්‍යන්තර කෝණයක අගය කීයද?

(1) අංශක 30 (2) අංශක 45 (3) අංශක 60

(3) අංශක 120 (5) අංශක 180

20. අංශක 180 ක කෝණයක් දක්නට ලැබෙන්නේ මේ අතරින් කුමන දිශා අතරද ?

(1) උතුරු හා නැගෙනහිර (2) ඊසාන හා දකුණ (3) වයඹ හා ගිනිකොන

(4) නිරිත හා බස්නාහිර (5) දකුණ හා නිරිත

21. රනිල කුලයේ ශාකවල මූල ගැටිතිවල ඇති රයිසෝබියම් බැක්ටීරියාව මගින් පසට එකතුවන ප්‍රධානම පෝෂකය මින් කුමක්ද?

(1) පොස්පරස් (2) නයිට්‍රජන් (3) පොටෑසියම්

(4) මැග්නීසියම් (5) බෙරිලියම්

22. දළඹුවකු වැඩෙන්නේ මින් කවරෙකු වීමටද?

(1) සමනලයකු (2) ගෙම්බකු (3) ගැරඩියකු

(4) හාවෙකු (5) මී මැස්සෙකු

23. සම්මත ක්‍රමයට සිතියම් සංකේත කිරීමේදී ප්‍රධාන මාර්ග සංකේතවත් කරන්නේ කුමන වර්ණයෙන්ද?

(1) රතු (2) කහ (3) නිල් (4) දුඹුරු (5) දම්

24. ඓතිහාසික තොරතුරු ඇතුළත් මහා වංශයට මුල් වූ ග්‍රන්ථය මින් කවරක්ද?

(1) සීහලට්ඨකතා මහා වංසය

(2) දීප වංශය

(3) උත්තර විහාරට්ඨකතාව

(4) වංසත්ථප්පකාසිනිය

(5) චූල වංශය

25. ශ්‍රී ලංකාවේ පොල් පර්යේෂණාගාරය පිහිටියේ,

(1) අගලවත්ත (2) ලුණුවිල (3) කැලණිය

(4) තලවකැලේ (5) මාතලේ

26. ලී කැටයම් කැපීමේදී යොදාගන්නා ප්‍රධාන උපකරණ ද්විත්වය වන්නේ,

(1) නියන හා අතකොලුව (2) මිටිය හා මනිස්ලැල්ල (3) ලඹය හා කැටයත්ත

(4) යතුකැටයහා අඩුව (5) බුරුමය හා කියත

27. පහත සඳහන් ස්ථාන අතරින් මුලින්ම ඉදිකළ ස්ථානය වන්නේ කුමක්ද?

(1) දළදා මාලිගාව (2) මිරිසවැටිය දාගැබ (3) පොලොන්නරුව ගල් විහාරය

(4) ඇම්බැක්කේ දේවාලය (5) වටදා ගෙය

28. කඳෙහි ආහාර තැන්පත් කරන අවස්ථාවක් වන්නේ මින් කුමක්ද ?

(1) කැරට් (2) රාබු (3) බිට් (4) අර්තාපල් (5) නෝකෝල්

29. නැතිවූ ජංගම දුරකථනයක් සොයා ගැනිමට දැනුම් දිය යුතු ආයතනය මුළු කුමක්ද ?

(1) ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය

(2) විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

(3) ඩිජිටල් යටිතල පහසුකම් හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය

(4) විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යංශය

(5) ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව

30. සාමාන්‍යයෙන් වාහන ටයර් පිරවීම සඳහා යොදා ගන්නා වායුවක් වන්නේ මින් කුමක්ද?

(1) නයිට්‍රජන් (2) ඔක්සිජන් (3) හයිට්‍රජන් (4) හීලියම් (5) මීතේන්

31. මුහුණු පොත සමඟ සෘජුව සම්බන්ධ විය හැකි සමාජ ජාල මාධ්‍යයක් වන්නේ මින් කුමක්ද?

(1) ඉන්ස්ටර්ග්‍රෑම් (2) වට්ස්ඇප් (3) වයිබර් (4) වීචැට් (5) ඉමෝ

32. සේද මාවතට අයත්ව තිබුණු රටක් නොවන්නේ මින් කුමක්ද?

(1) තුර්කිය (2) ඉන්දියාව (3) නෝර්වේ (4) චීනය (5) ජපානය

33. ශ්‍රී වික්‍රම රාජසිංහ රජු පිළිබඳ වැරදි ප්‍රකාශය මින් කුමක්ද ?

1) රාජ්‍යත්වයට පෙර නම කන්නසාමි නායිදු ය
2) ඉංග්‍රීසින්ගේ අත්අඩංගුවට පත්වූයේ මැද මහනුවරදීය
3) මියගියේ ඉන්දියාවේ වෙල්ලෝරාවේ දී ය
4) ඔහුගේ පියා රාජාධිරාජසිංහය
5) මද්දුම බණ්ඩාර මරණයට පත් කිරීමට අණ දුන්නේ මොහුය

34. ඔලිම්පික් තරගයකදි දුර පනින්නේ කවරක් මතටද?

(1) වැලි මතට (2) පිහාටු මතට (3) ජලය මතට (4) මඩ මතට (5) මෙට්ටයක් මතට

35. පෘථිවියට සමීපයේම සිටින්නේ මේ අතරින් කවරෙක්ද?

(1) සූර්යයා (2) චන්ද්‍රයා (3) අඟහරු (4) සිකුරු (5) බ්‍රහස්පති

36. පළමුවන ඔලිම්පික් උළෙල පැවැත්වුයේ මින් කුමන රටකද ?

(1) එංගලන්තය (2) ග්‍රීසිය (3) ඕස්ට්‍රේලියාව (4) ප්‍රංශය (6) ශ්‍රී ලංකාව

37. දම්පැහැ මලක් දැකිය නොහැක්කේ මින් කුමන පැළෑටියේ ද?

(1) පොල් පලා (2) මොනර කුඩුම්බිය (3) උඳුපියලිය (4) නිදිකුම්බා (5) ගස් නිවිති

38. ආප්ප සෑදීම සඳහා සැකසූ පිටි මිශ්‍රණයක බුබුළු ඇති වන්නේ කවර වායුව නිසාද ?

(1) ඔක්සිජන් (2) කාබන්ඩයොක්සයිඩ් (3) නයිට්‍රජන් (4) හයිට්‍රජන් (5) මීතේන්

39. ශ්‍රී ලංකාවේ 2019 වර්ෂයේ ජනවාරි මාසයේ සිට මාර්තු මාසය දක්වා රජයේ වියදම් පියවා ගැනීමට රජයේ ඒකාබද්ධ අරමුදලින් මුදල් වෙන් කරගත් ක්‍රමය වන්නේ,

(1) විසර්ජන පනතක් මගිනි
(2) අයවැය ලේඛනයක් මගිනි
(3) අතුරු සම්මත ගිණුමක් මගිනි
(4) පරිපූරක වැය ඇස්තමේන්තුවක් මගිනි
(5) ජනාධිපතිවරයාගේ නියෝගයක් මගිනි

40. ලංකාවේ ජනගහනය අඩුම දිස්ත්‍රික්කය වන්නේ,

(1) මුලතිව් (2) මන්නාරම (3) කොළඹ (4) කිලිනොච්චිය (5) කෑගල්ල

41. V.O.C යන ඉංග්‍රීසි අකුරු සහිත කාසි අයත් වන්නේ,

(1) ඉංග්‍රීසි වෙළඳ සමාගමකට
(2) ලන්දේසි වෙළඳ සමාගමකට
(3) පෘතුග්‍රීසි වෙළඳ සමාගමකට
(4) ඉන්දීය වෙළඳ සමාගමකට
(5) ප්‍රංශ වෙළඳ සමාගමකට

42. වර්තමානයේ යුරෝපා සංගමය සමඟ අර්බුදකාරී වාතාවරණයක් ගොඩ නගාගෙන ඇති රට වන්නේ,

(1) ප්‍රංශය (2) ජර්මනිය (3) එක්සත් රාජධානිය
(4) ඇමරිකා එක්සත් ජනපදය (5) බෙල්ජියම

43. කලාපීය සහයෝගිතාව සඳහා වු දකුණු ආසියානු සංවිධානය පිළිබඳ සාවද්‍ය පිළිතුර තෝරන්න.

1) අන්තර්ජාතික ක්ෂේත්‍රයේදි හඳුන්වනු ලබන්නෙ ''සාක්'' යන නමිනි
2) ආරම්භක වශයෙන් දකුණු ආසියාතික රාජ්‍යයන් හතක් විසින් 1985 දෙසැම්බර් 08 දින පිහිටුවන ලදි
3) ආර්ථික සාමාජික, සංස්කෘතික තාක්‍ෂණික විද්‍යාත්මක යනාදි ක්ෂේත්‍රයන්හි කලාපිය සහයෝගිතාව වර්ධනය කිරීම ඉලක්ක කරගෙන ඇත.
4) ඉහළම තීරණ ගැනීමේ ආයතනය වන රාජ්‍ය නායක සමුළුව වාර්ෂිකව පවත්වනු ලැබේ.
5) තීරණ ගැනිම කරනු ලබන්නේ බහුතර ඡන්දයෙනි.

44. 2019 මාර්තු 28 දිනට යෙදි තිබුණු මෙවර ලෝක කාන්තා දිනයේ තේමාව වූයේ,

1) ලොවට ජයක් සොඳුරු ලොවක්
2) සුහුරු කතක් සොඳුරු ලොවක්
3) පිරුණු ලොවක් දිනු කතක්
4) සවිබල දැතට ගෙන දෙමු සවියක්
5) සොඳුරු නිවසට සවිය ඔබ විය

45. මෑතකදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ 2019 ශ්‍රී ලංකා අයවැය වාර්තාව සැකසිමේදී මූලික කොටගත් තේමාව වනුයේ,

(1) ජනතාවට ශක්තිය හා දුප්පතුන්ට රැකවරණය
(2) තරුණ ශ්‍රමයට වැඩි වටිනාකමක්
(3) ගොවිතැන නංවමු රටට දිරි දෙමු
(4) ව්‍යවසායකයා වෙත වැඩි නැඹුරුවක්
(5) ගෙවතු වවමු. රට නංවමු

46. පහත ඒවා අතුරෙන් නිවැරදි ඉන්ද්‍රීය ගෝචර කරුණක් වන්නේ කුමක්ද?

(1) මස් ප්‍රෝටීන් සහිත ආහාරයකි

(2) මාළු මැටි බඳුන්වල පිසූවිට රසවත්ය

(3) මස් , මාළු වලට වලට වඩා රසවත්ය

(4) ළමයින් මාළුවලට වඩා මස් වලට කැමතිය

(5) වැඩියෙන් පිසූ මාළු අඩුවෙන් පිසූ මස් වලට වඩා රසවත්ය

47. පහත ඒවා අතුරෙන් හුදු මතයක් වන්නේ කුමක්ද?

(1) බත්, පිෂ්ටය සහිත ආහාරයකි

(2) බත්, ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආහාරය වේ

(3) බත්, සම්බෝලය සමඟ රසවත්ය

(4) ඝර්ම කලාපීය රටවල වී වගා කෙරේ

(5) වී ශ්‍රී ලංකාවේ ප්‍රධාන බෝගයකි

48. 10, 17, 26, 37, .................. රටාවේ ඊළඟ පදය වන්නේ,

(1) 48 (2) 50 (3) 52 (4) 56 (5) 60

49. මිනිසුන් 10 දෙනෙකුට දින 5 කදී දිනකට පැය 2 ක් වැඩකර නිමකළ හැකි වැඩක් මිනිස්සු දෙදෙනෙකුට දිනකට පැය 5 ක් වැඩකර නිම කිරිමට යන දින ගණන වන්නේ,

(1) 8 (2) 10 (3) 15 (4) 12 (5) 16

50. සංඛ්‍යාවක් 5 න් බෙදූවිට එකක් ඉතිරි වේ. 6 න් බෙදූ විට ද එකක් ඉතිරි වේ. 7 න් බෙදූ විටද එකක් ඉතිරි වේ. එසේ පවතින කුඩාම සංඛ්‍යාව වන්නේ,

(1) 61 (2) 71 (3) 211 (4) 91 (5) 201

51. පූර්ණ සංඛ්‍යා දෙකක වර්ග වල ඓක්‍යය 193 කි. කුඩා සංඛ්‍යාවෙන් 3 ක් අඩු කළ විට විශාල සංඛ්‍යාවෙන් $\frac{1}{3}$ ට සමාන වේ. මෙම අවශ්‍යතා සපුරාලන සංඛ්‍යා දෙක වනුයේ,

(1) 5, 6 (2) 8, 15 (3) 6, 9 (4) 7, 12 (5) 8 , 12

52. මිනිසෙකු තමාට ලැබෙන රු. 1100 න් රු. 275 ක් ඉතිරි කරයි. රු. 1800 ක් ඔහුට ලැබුනොත් කීයක් ඉතිරි කරයිද ?

(1) රු. 450 (2) රු. 325 (3) රු. 350 (4) රු. 375 (5) රු. 425

53. ඉනිම් 12 කින් පසු ක්‍රිකට් ක්‍රීඩකයකුගේ සාමාන්‍ය ලකුණු සංඛ්‍යාව 13.5 ක් විය. ඊළඟ ඉනිමෙන් පසුව එය 14 ක් විය. එම ඉනිමේදී ඔහු ලැබූ ලකුණු සංඛ්‍යාව වනුයේ,

(1) 15 (2) 18 (3) 20 (4) 22 (5) 25

54. සමචතුරස්‍ර කඩදාසියකින් එහි එක් ශීර්ෂයක්ද හසුවන සේ සමචතුරස්‍ර කොටසක් කපා වෙන් කළ පසු ඉතිරි වූ කොටසේ වර්ගඵලය $125 \text{ cm}^2$ විය. විශාලතර සමචතුරස්‍රයේ පැත්තක දිග කපා වෙන්කරගත් සමචතුරස්‍රයේ පැත්තක දිගට වඩා 5 cm ක් වැඩිය. සමචතුරස්‍ර දෙකේ පැතිවල දිග වනුයේ,


(1) 5 cm, 15 cm (2) 8 cm, 13 cm (3) 10 cm, 15 cm (4) 5 cm, 10 cm (5) 9 cm, 14 cm

55. නලයක් මින් මිනි. 9 කදී ටැංකියෙන් $\frac{2}{5}$ ක් පිරවිය හැක. ටැංකියෙන් $\frac{13}{15}$ ක් පිරෙනේනේ කොපමණ කාලයකින් ද?

(1) මිනි. 15 (2) මිනි. 18 (3) මිනි. $19\frac{1}{2}$ (4) මිනි. 21 (5) මිනි.$22\ \frac{1}{2}$

56. පේළි 42 කින් යුත් පිටු 312 ක් ඇති පොතක් ඇත. පිටුවකට පේළි 39 ක් වුවහොත් එම පොතෙහි පිටු සංඛ්‍යාව වනුයේ,

(1) 336 (2) 350 (3) 320 (4) 340 (5) 326

57. 

රූපයේ ඇති ත්‍රිකෝණ ගණන කියද?

(1) 6 (2) 10 (3) 12

(4) 15 (5) 18

58. 0 සිට 20 තෙක් ඇති ප්‍රථමක සංඛ්‍යා ගණන වන්නේ කීයද?

(1) 5 (2) 6 (3) 8 (4) 10 (5) 12

59. කෑම රසවත් කිරීම සඳහා නිවසේ භාවිත කරන සාමාන්‍ය ලුණු වල රසායනික නාමය වන්නේ,

(1) කැල්සියම් ක්ලෝරයිඩ්

(2) සෝඩියම් ක්ලෝරයිඩ්

(3) කැල්සියම් හයිඩ්‍රොක්සයිඩ්

(4) මැග්නීසියම් ක්ලෝරයිඩ්

(5) මැග්නීසියම් හයිඩ්‍රොක්සයිඩ්

60. A, B, C යනු ව්‍යාපාරයක හිමිකරුවන් තිදෙනෙකි. එම ව්‍යාපාරය සඳහා ඔවුන් යෙදූ මුදල අනුව ලැබූ ලාභය බෙදා ගත්තේ ය. A ට ලාභයෙන් $\frac{2}{7}$ ක ප්‍රමාණයක් ද එමෙන් දෙගුණයක් B ටද ලබා දී ඉතිරිය C ට දුන්නේය. A හා B දෙදෙනාටම වෙන්වූයේ රුපියල් 84 000 ක් නම් ව්‍යාපාරයෙන් ලද ලාභය සොයන්න.

(1) රු. 90 000 (2) රු. 120 000 (3) රු. 100 000 (4) රු. 98 000 (5) රු. 108 000